10 ශ්‍රේණිය

නිපුණතාව 2.0

## ස්වකීය පකරිල්පන මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

### 2.4 චරිතයක්, සිදුවීමක්, අවස්ථාවක් හෝ කිසියම් භාණ්ඩයක් තේමා කරගත් සාමූහිකව හා කේවල වශයෙන් නිර්මාණාත්මක නිරූපණයෙහි යෙදෙයි.

පන්තියේ සියලු ළමුන් නාට්‍යයක් බැලීමට මෙන් එක් පසෙක වාඩි කරවා පෙර දැනුම් දෙන ලද ඉහළ පන්තියක දක්ෂ දරුවෙකු ලවා ක්ෂණික නිරූපණයක් ඉදිරිපත් කරවීම කරනවා. ඉන් පසු ඔහුට හෝ ඇයට ප්‍රශංසා කොට පන්තියේ සිසුන් කිහිප දෙනෙකුට ''පොළට කොවිඩ් රෝගියෙකු පැමිණීම'' යන තේමාවෙන් ඉදිරිපත් කිරීමක් සිදු කරන ලෙස අවස්ථාව දෙනවා. ඉන් පසු පන්තියේ සිසුන් සමග එම ඉදිරිපත් කළ අවස්ථා ගැන මෙවන් සාකච්ඡාවක් කරනවා.

ළමයි, ඔයගොල්ලො දැක්කේ අපි ජීවත්වන අපේ වටපිටාවේ සිදුවන සිදුවීමක් හා අවස්ථාවක්. මේ අවස්ථාවල හා සිදුවීම්වල විවිධ චරිත අපිට දකින්න ලැබෙනවා. ඉතිං මේ වගේ අවස්ථා ඉදිරිපත් කරන්න නම් අපිට වටපිටාවේ සිදුවන දේ ගැන හොඳ අවබෝධයක්, අත්දැකීම් තියෙන්න ඕනේ.

හරි, දැන් නැගිටලා රවුමක් හැදෙන්න. මෙතන ඉඳල ගණං කරන්න එකේ ඉඳල පහ වෙනකල්. හරි කණ්ඩායම් පහක් වෙන්න වෙන වෙනම අංක අනුව හැදෙන්න. දැන් කණ්ඩායමෙන් එක්කෙනා ගානෙ ඇවිත් මේ තුණ්ඩුවක් ගන්න. (පෙර සූදානම් කරන ලද තේමා ලියූ තුණ්ඩු පහක් අහඹු ලෙස කණ්ඩායම් අතර බෙදනවා) - මාතෘකා- (වෙළඳපොළක්, විවාහ මංගල්‍යයක්, අවුරුදු උළෙලක්, මළ ගෙදරක අවස්ථාවක්, බස් රථයක් තුළ වැනි)සූදානම් වවීමට ඔබට මිනිත්තු දහයක් ලැබෙනවා. කණ්ඩායම් පහේ ඉදිරිපත් කිරීම් නැරඹීම.

........................................................................................................

පෙර සූදානම් කරගත් මාතෘකා කිහිපයක් තුණ්ඩුවල ලියා දෙදෙනෙක් ඉදිරියට ගෙන ඔවුන්ට ඒවායෙන් අහඹු ලෙස තෝරාගන්නට දෙනවා.

මේ තුණ්ඩුවල තිබෙන අවස්ථාවක් තෝරාගෙන තනි තනිව ඉදිරිපත් කරන්න ඕනේ. එක්කෙනෙක් ඉදිරිපත් කරන අතරතුර අනෙක් කෙනාට සූදානම් වෙන්න පුළුවන්. අනිත් හැමෝම ඉදිරිපත් කිරීම නරඹන්න ඕනේ. සාමාන්‍යපෙළ ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබා දෙන ආකාරයේ මාතෘකා කිහිපයක්. (ඔබ බස් රථයක ගමන් කරන විට යමෙක් ඔබ ඔහුගේ පසුම්බිය ගත් බවට චෝදනා කරනවා... එවැනි)

පුටුවක්, පත්තරයක්, කොස්සක්, බෝතලයක්, සෙරෙප්පුවක් පන්තිය ඉදිරියෙන් තබනවා.

දැන් එක එක්කෙනා ඇවිත් මේ ද්‍රව්‍යවලින් එකක් අරගෙන යම් ඉද්රිපත් කිරීමක් කරන්න ඕනේ. හැබැයි ඒ සැබෑ භාණ්ඩය විදියට යොදා ගන්න බෑ. ඒක ආදේශකයක් කරගන්න

ඕනේ. නිදසුනක් කිව්වොත් මේ කොස්ස ගිටාර් එකක් විදියට යොදා ගැනීම වගේ. සිසු ඉදිරිපත් කිරීම් අගය කරනවා.

හරි දැන් ඕගොල්ලෝ විවිධ ආකාරයේ ඉදිරිපත් කිරීම් සිදු කළා. මෙවැනි ඉදිරිපත් කිරීම්වලදී අපිට ගොඩාක් දේවල් හිතන්න වෙනවා. ද්‍රව්‍ය උපයෝගිකරගෙන කරන ඉදිරිපත් කිරීම්වලදී ඒවා අවස්ථාව හා තරකානුකූලව බද්ධ කරගන්න ඕනේ. ඒ අවස්ථාව අර්ථවත් වෙන්න ඕනේ.

මාතෘකානුකූල කේවල ඉදිරිපත් කිරීමකදී ඔබට ලැබෙන්නේ කතාවක මැද කොටස. ඔබ එහි ආරම්භය හා අවසානය නිර්මානාත්මකව, තර්කානුකූලව, නාට්‍යොචිත විදියට ගොඩනගා ගත යුතු වෙනවා. ඒ වගේ ම චරිතය ගැනත් හිතන්න වෙනවා.

කණ්ඩායම් ඉදිරිපත් කිරීමකදිත් ඒ කාරණා ටික ඒ විදියට ම බලපානවා. ඒ අවස්ථාවේ කිසියම් සිදුවීමක් නාට්‍යොචිතව ඉදිරිපත් කළ යුතුයි. විවිධ චරිත නිරූපණයක් ද ඒ හරහා මතු කර ගත යුතුයි.